# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# ஊவா மாகாண கல்வித் திணைக்களம்
# UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

## පෙරහුරු පරීක්ෂණය - 2017

| 11ශ්‍රේණිය | ඉස්ලාම් - II | කාලය පැය දෙකයි |
| --- | --- | --- |

- **පළමුවැනි ප්‍රශ්නය හා තෝරා ගත් තවත් ප්‍රශ්න හතරක්. ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.**

---

01. කෙටි පිළිතුරු සපයන්න.
   i. "වසතියයා" යන අරාබි වචනයෙන් අදහස් කරන්නේ කුමක් ද?
   ii. මූලික නිශ්චිත ඉබාදත්හි ශරීරය හා ක්‍රියාව සම්බන්ධ වූ ඉබාදත් දෙකක් සඳහන් කරන්න.
   iii. ආගම සහ සුහ්ෆ් දෙකම ලද නබිවරයා කවු ද? එතුමා ලද ආගම හා සුහ්ෆ් සංඛ්‍යාව කීය ද?
   iv. අකීදාවෙහි අර්රුහානියියාත් හි අඩංගු කරුණු මොනවා ද?
   v. අල්මා උත් තහුර් යනු කුමක් ද? එහි ප්‍රධාන කොටස් තුන කවරේ ද?
   vi. ඉස්ලාමයට අනුව නජීස් වර්ග කොට දක්වා එක් එක් නජීස් වර්ග සඳහා උදාහරණයක් බැගින් දක්වන්න.
   vii. උම්මත්වරයෙකු තුළ දැකිය හැකි ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
   viii. ෆික්හුල් අව්ලවියාත් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
   ix. ඊමානයට හානි පමුණුවන කරුණු මොනවා ද යන්න කෙටියෙන් දක්වන්න.
   x. ඉස්ලාමීය අකීදාව යනු කුමක් ද? අහ්ලුස් සුන්නාහ් වල් ජමාඅත් යන්නෙහි අර්ථය කවරේ ද?

02. i. ඉස්ලාමයට අනුව දික්කසාදවීම් කොටස් තුන දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න.
   ii. "ඉද්දා" යනු කුමක් ද? ඉද්දා සිටීමෙන් අත්වන ප්‍රයෝජන කවරේ ද?
   iii. ඉස්ලාමීය විවාහයක් සිදු වීමට අවශ්‍ය වන කොන්දේසින් මොනවා ද?

.

03. i. ඉජ්තිහාද් යනු කුමක් ද? මුජ්තහිද් කෙනෙකුට තිබිය යුතු සුදුසුකම් මොනවා ද?
   ii. ඉජ්මාඋ යනු කුමක් ද? එහි කොටස් කවරේ ද? කෙටියෙන් විස්තර කරන්න.
   iii. ෆික්හ් යන ඉස්ලාමීය නීති ක්ෂේත්‍රයේ ඉමාම් අබුහනීෆා (රහ්) තුමාගෙන් ඉටු වූ සේවය කෙටියෙන් විස්තර කරන්න.

04. i. කුලෆාඋර් රාශිදූන් සිව් දෙනාගෙන් පළමු කලීෆා අබුබක්කර් (රලි) තුමාගෙන් ඉස්ලාමයට හා මුස්ලිම් සමාජයට ඉටු වූ සේවාවන් කවරේ ද?
   ii. ශ්‍රී ලංකා ආර්ථික දියුණුව උදෙසා අරාබි මුස්ලිම්වරු දායක වූ ආකාරය විස්තර කරන්න.
   iii. ශ්‍රී ලංකාවේ නිදහසට දායකත්වය ලබා දුන් මුස්ලිම් නායකයන් දෙදෙනා නම්කොට ඔවුන්ගෙන් සමාජයට ඉටු වූ සේවය කවරේ ද?

05. i. ඉබාදත් යනු කුමක් ද? මුස්ලිම්වරයෙකුට අල්ලාහ් විසින් අනිවාර්යය කරන ලද මූලික ඉබාදතයන් මොනවා ද?
   ii. අනිවාර්ය කරන ලද මූලික ඉබාදත් හි ප්‍රධාන අරමුණ කුමක් ද?
   iii. මුස්ලිම්වරයෙකුගේ දෛනික ක්‍රියාකාරකම් ඉබාදතයක් ලෙස පත්වීමට නම් තිබිය යුතු කොන්දේසින් කවරේ ද?

06. i. නබි (සල්) තුමාණන්ගේ කාලයේ මක්කා කාල වකවානුවේ ධර්ම ප්‍රචාරක කටයුතු වල දී යොදා ගත් ඉස්ලාමීය සන්නිවේදන ක්‍රමයන් කවරේ ද?
   ii. වෙළඳ ගණුදෙනුවල දී ඉස්ලාමය තහනම් කර ඇති දේවල් මොනවා ද?
   iii. අල්කුරානයේ පවතින විශ්මිතයන් කවරේ ද?

07. පහත සඳහන් ඒවායින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   i. ශාරීරික හා මානසික යෝග්‍යතාවය රැක ගැනීම සඳහා ඉස්ලාමය පෙන්වා දුන් විවිධ ක්‍රියාමාර්ග.
   ii. තාරුණ්‍ය කාලය යහපත් මං කරා ගෙන යාමට ඉස්ලාමය පෙන්වා දී ඇති මඟපෙන්වීම්.
   iii. ඉස්ලාමය පෙන්වා දී ඇති මානව අයිතිවාසිකම්.

www.edudept.up.gov.lk

iv. ඉපයීමට අදාල වන ඉස්ලාමීය ෂරිආ නීතිය

www.edudept.up.gov.lk